කඩුගන්නාව නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුලි 09 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව සතුව පැවති වාහන 5 ක වටිනාකම රු.4,573,450 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු 3 ක ලැබිය යුතු පොලී ආදායම රු.68,649 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ධූමායන යන්ත්‍රයේ වටිනාකම රු.150,000 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පුස්තකාල පොත්වල වටිනාකම රු.143,433 ක් වුවත්, රු.131,290 ක් ලෙස රු.12,143 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.91,183 ක් වූ පුස්තකාල පොත් 358 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වූ ආයුර්වේද තොගයේ වටිනාකම රු.74,273 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු රු.191,700 ක් වූ හිඟ ආදායම් ගිණුම්වලින් මගහැරී තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(උ) පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබුණු රු.16,708 ක ලද වට්ටම් ගිණුම්ගතකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ ආදායම ඇස්තමේන්තු කර ගිණුම්ගතකර නොතිබුණි.

(එ) ඉකුත් වර්ෂවල මුද්දර ගාස්තු ආදායම ලෙස රු.1,300,000 ක් ලැබී තිබියදී සමාලෝචිත වර්ෂයේ මුද්දර බදු ආදායම රු.239,000 ක් ලෙස අඩුවෙන් ඇස්තමේන්තු කර ගිණුම්ගතකර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පරිසර පුවරු වටිනාකම රු.24,200 ක් ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්
----------------------
සභාව විසින් කඩ කුලී හා බලපත්‍ර ආදායම් අය කර ගැනීමට හා අනවසර ඉදිකිරීම් වෙනුවෙන් පාර්ශවකරුවන් 16 දෙනෙකුට විරුද්ධව අධිකරණයේ නඩු ගොනුකර ඇතත්, ගිණුම්කරණ සටහන් මගින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 එකතු වටිනාකම රු.4,320,317 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර, කාලයට අදාළ ගිණුම් ශේෂ 2ක වටිනාකම රු.375,345 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතු වටිනාකම රු.4,628,319 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර වූ ශේෂ 2 ක වටිනාකම රු.272,288 ක් හා වසර 5 ක් ඉක්මවූ ගිණුම් ශේෂවල වටිනාකම රු.3,424,388 ක් විය.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
---------------------------------------------------------
අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,951,271 ක් වූ ගනුදෙනු 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්
--------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 2015 ජුනි 19 දිනැති අංක1919-81 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය. | 172,500 | සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු 5 කින් ආදායම් අය කරගෙන නොතිබුණි. |
| (ආ) | 1980 අංක 47 ජාතික පරිසර පනතේ 23(අ) වගන්තිය යටතේ නිකුත් කර ඇති අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති පාරිසරික ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය | - | පරිසර බලපත්‍ර අලුත් කළයුතු ව්‍යාපාරික ආයතන 3 ක බලපත්‍ර අලුත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ | | |
| | (i) 1 (v) ඡේදය | 100,000 | කඩ කාමරවල එකවර ගෙවීමේ මුදලින් සියයට 50 ක් ගෙවා ඉතිරිය වාරික 6 කින් අයකර ගත යුතු වුවද, මෙම මුදල් කාලීනව අයකර ගෙන නොතිබුණි. |
| | (ii) 4 ඡේදය | 510,968 | සමාලෝචිත වර්ෂය අවසානයට වූ කඩ කුලී අය කරගෙන නොතිබුණි. |
| | (iii) 4 (i) ඡේදය | - | 2017 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලිය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| | (iv) 10 ඡේදය | - | කඩ කාමර අතුරු බදු දිය නොහැකි වුවත්, බදුකරුවන් විසින් විවිධ ආකාරයට විවිධ පුද්ගලයන් වෙත කඩ කාමර අතුරු බදු දීම සිදුකර තිබුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3:4 | | එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලබාගෙන රු.162,700 ක ටයර් සහ රු.38,679 කට රෝලර් දොරක් මිලදී ගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,871,783 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,851,137 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,500,000 | 7,635,212 | 7,349,477 | 5,873,578 | 7,500,000 | 7,569,773 | - | 5,452,500 |
| කුලී | 3,309,000 | 4,175,392 | 3,927,442 | 765,395 | 2,759,400 | 3,230,389 | 3,197,895 | 517,445 |
| බලපත්‍ර ගාස්තු | 1,150,000 | 1,426,954 | 1,399,954 | 27,000 | 1,030,000 | 1,235,800 | 1,222,300 | 13,500 |
| වෙනත් ආදායම් | 2,826,000 | 911,428 | 1,914,595 | 736,238 | 5,275,000 | 1,824,263 | 3,206,664 | 704,255 |
| | 14,785,000 | 14,148,986 | 14,591,468 | 7,402,211 | 16,564,400 | 13,860,225 | 7,626,859 | 6,687,700 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

2016 ඔක්තෝබර් මස 21 දිනැති අංක 1990 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් කසළ බදු අයකර ගැනීමට සැලසුම් කර ඇතත්, එම බදු මුදල් අයකරගෙන නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ආදායම රු.5,452,500 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දක්වා බිල්කළ ආදායම රු.7,635,212 ක් විය. ඉකුත් වර්ෂයේ හිඟයෙන් රු.2,337,926 ක් හා බිල්කළ ආදායමෙන් රු.5,011,551 ක් අයකර ගෙන තිබූ අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 42 ක් හා සියයට 66 ක් විය. ඒ අනුව ආදායම් රැස් කිරීම් දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) රජයේ ආයතන වලින් අයවිය යුතු රු.788,928 ක් වූ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි.

2.2.4 කුලී

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.263,118 ක් වූ හිඟ කඩකුලී ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල්කල ආදායම රු.2,107,612 ක් විය. ඉකුත් වර්ෂයේ හිඟයෙන් රු.111,750 ක් හා බිල්කල ආදායමෙන් රු.1,748,012 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.252,826 ක පොළ බදු ශේෂය අයකරගෙන නොතිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.27,000 ක් අයකරගෙන නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

-------------------

තානායම් ගාස්තු

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.195,000 ක තානායම් ගාස්තු ශේෂය අයකරගෙන නොතිබුණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.113,348 ක් හා මුද්දර ගාස්තු රු.426,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 14 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 4 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

---------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 10 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම සිදුකර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන ටොන් 2 ක පමණ ඝන අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා එකතු කර දිරාපත්වන කසළ ටොන් 1 ක පමණ ප්‍රමාණයක් රු.1,000 බැගින් ගෙවා යටිනුවර කසළ අංගනයට භාරදෙමින් තිබුණි. දිරාපත් නොවන කසළ බැහැර කරලීම සඳහා රු.3,110,000 ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුණ අතර, දිරාපත් නොවන කසළ වර්තමානයේ පැරණි නිල නිවාසයක වර්ගීකරණය කර අවිධිමත්ව ගොඩගසා තිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

-------------------

(i) දිරාපත් නොවන කසළ බැහැර කරන ස්ථානයේ මේ වන විට විශාල කසළ ප්‍රමාණයක් ඒකරාශී වී කන්දක් ලෙස ඉහළට එසවී ඇති අතර, එය පාමුලම පෞද්ගලික නිවසක් හා ඒ ආසන්නයේම පෞද්ගලික නිවාස කිහිපයක් ඇති බැවින්, අධික දුර්ගන්ධයක් වහනය වන බව ප්‍රදේශවාසීන් වාර්තා කර තිබුණි.

(ii) සභාව අවට අවිධිමත් ලෙස කසළ බැහැර කර තිබීම නිසා ඒ අවට ඉතාම අපිරිසිදුව නිරන්තර දුර්ගන්ධය වහනය වෙමින් පැවති අතර, දිරාපත් නොවන ද්‍රව්‍ය කාණුවලට දමා තිබූ බැවින් කාණුවල අපවිත්‍ර ද්‍රව්‍ය ඒකරාශී වී තිබුණි

(ඊ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පිළිමතලාවේ සතිපොළේ හිඟ බදු මුදල බදුකරුගේ දේපළ වෙන්දේසි කර අයකර ගන්නා ලෙස නඩුවේ අවසන් තීරණය ලබා දී වසරකට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, රු.252,827 ක පොළ බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පිළිමතලාව සතිපොළ බදුකරුවකු සමඟ වසරක කාලයකට රු.1,010,000 කට ගිවිසුම්ගත වී තිබියදී කළමනාකරණ කමිටුව මගින් ලැබිය යුතු පොළ බදු මුදල අඩු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට රු.25,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

------------------------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර තනතුරු 6 ක සේවක පුරප්පාඩු 12 ක් විය.

(ආ) සේවක ණය

---------------

මියගිය සහ විශ්‍රාම ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් රු.12,340 ක ණයශේෂ අයකරගෙන නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 14 දරන කඩ කාමරය ගිවිසුමකින් තොරව පුද්ගලයෙක් කාර්යාලයක් පවත්වාගෙන යන අතර, එම කඩ කාමරය සභාවට පවරාගෙන විධිමත්ව ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදාහනාගාරය අලුත්වැඩියාව සඳහා ප්‍රසම්පාදන සිදු කිරීමේදී අවම මිල වූ රු.628,650 ක මිල ඉදිරිපත් කර තිබුණු ආයතනය මඟින් අලුත්වැඩියාව සිදුකර ගැනීමට යාන්ත්‍රික

ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර තිබියදීත්, අවම මිල ප්‍රතික්ෂේප කිරීමට හේතු නොදක්වා ලේකම්වරයා විසින් වෙනත් ආයතනයකින් රු.901,224 කට අලුත්වැඩියාව සිදු කිරීම හේතුවෙන් සභාවට රු.272,574 ක පාඩුවක් සිදුව තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
------------------------------

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම
---------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභාව විසින් කසළ බැහැර කිරීමට භාවිතා කරනු ලබන ඉඩමේ භුක්තිය කඩුගන්නාව නගර සභාවට පවරා දී ඇතත්, එහි මායිම් හඳුනා ගත හැකි වන පරිදි වැටවල් ගසා ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ කලාදුරුකොටුව හා මැංගුස්වත්ත ඉඩම්වල මායිම් හඳුනාගෙන ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීමෙන් අනවසර අල්ලා ගැනීම් හා පදිංචි වීම සඳහා ඉඩ සැලසී තිබුණි.

3.5.2 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම
--------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ග අඩි 500 ක් පමණ වන අංක 162/6 දරන රජයේ නිවාසය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර එහි නොදිරන කසළ ගොඩගසා තිබුණි .

(ආ) නව වෙළඳපළ සංකීර්ණය දීර්ඝ කාලයකින් නවීකරණය කිරීමක් සිදු නොකිරීම නිසා ආකර්ශනීය පෙනුමක් නොතිබීම හේතුවෙන් පාරිභෝගික ප්‍රවේශය ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) සභාව සතු පැරණි කාර්යාලය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණි. මහනුවර කොළඹ මාර්ගය අසල පිහිටා ඇති වාණිජ වටිනාකමකින් යුත් මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර උපයෝජනය කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

3.5.3 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම
----------------------------------------------------------

සුපිරි වෙළඳ සංකීර්ණයේ හා නව වෙළඳ සංකීර්ණයේ සමහර කඩ කාමර වසා තිබූ අතර, මෙම කඩ කාමර වලින් රු.103,170 ක කුලී මුදලක් අය විය යුතුව තිබුණි.

3.5.4 පවරානොගත් වත්කම්
----------------------------

රු.1,200,000 ක වටිනාකම වූ ගිනි නිවන රථය සභාවට පවරා ගෙන නොතිබුණි.

3.5.5 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

(අ) රු.554,000 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 5 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) රු.7,967,144 ක වටිනාකමින් යුත් ගල්රෝල ඌන උපයෝජිතව පැවතුණි.

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් සභාව සතු ට්‍රැක්ටරයක එංජිම හා තිරිංග පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා 2017 මැයි 02 දින යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබාදුන් සහතිකය මත රු.173,141 ක් ගෙවා තිබුණු අතර, රථයේ රියදුරුගේ 2017 මැයි 15 දින දැනුම් දීම මත නැවතත් තිරිංග පද්ධතිය අලුත්වැඩියා කර රු.45,338 ක් ගෙවා තිබුණි.

3.7 ප්‍රසම්පාදනය

----------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.1,497,833 භාණ්ඩ හා සේවා මිලට ගෙන ඇතත්, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

3.7.2 සැපයීම් හා සේවා

----------------------

තනි ලාච්චුවේ ලියන මේස 2 ක් මිලට ගැනීම සඳහා අවශ්‍ය පිරිවිතර සභාව විසින් සැපයුම්කරුවන්ට ඉදිරිපත් කර නොතිබීම නිසා ආයතන තුන විසින් විවිධ ප්‍රමාණයේ මේස සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අටුපැන්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම

-----------------------------------------------

2017 වර්ෂයේ නගර සභා අරමුදල් යටතේ අටුපැන්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.200,000 ක ඇස්තමේන්තුවක් මත රු.195,923 ක මුදලකට කඩවත්ගම ග්‍රාම සංවර්ධන සමිතියට පවරා තිබුණි. මාර්ග පෘෂ්ඨය නියමිත ප්‍රමිතියෙන් නොතිබුණු අතර, මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් honeycomb (මී වද) තත්ත්වයක් පැවතුණි. මාර්ගයේ පතුල මට්ටම් කිරීම සඳහා මැටල් යොදා තිබූ අතර, එම ගල් කොන්ක්‍රීට් සමඟ බද්ධ නොවීම හේතුවෙන් පහසුවෙන් ගැලවී යන තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ආ) පහළ කඩුගන්නාව රජපිහිල්ල මාවත සංවර්ධනය කිරීම

-------------------------------------------------------------

2017 වර්ෂයේ නගර සභා අරමුදල් මත පහළ කඩුගන්නාව රජපිහිල්ල මාවත සංවර්ධනය කිරීම රු.500,000 ක ඇස්තමේන්තුවක් මත කඩවත්ගම ග්‍රාම සංවර්ධන සමිතියට 2017 සැප්තැම්බර් 07 දින පවරා තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මාර්ගය භාවිතා කරන ප්‍රතිලාභීන් ප්‍රමාණය කොපමණද යන්න සාධ්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

(ii) මෙම මාර්ගය සකස් කිරීමේදී පෙට්ටි බෝක්කුවක් යෙදීමට කටයුතු කර තිබුණද, එය නිසි ප්‍රමිතියකින් සැලසුම් කර නොතිබුණු අතර, බොක්කුවට ජලය පිවිසෙන ස්ථානය නොගැඹුරු පටු ස්ථානයක් වන බැවින් විශාල ජල කඳක් පැමිණෙන විට උතුරා යාමට ඉඩකඩ පැවතුණි.

(iii) පැති බැම්ම සකස් කිරීමේදී එහි බදාමවල ප්‍රමිතිය හා නිමාව සතුටුදායක නොවූ අතර, භෞතික පරීක්ෂාවේදී honeycomb තත්ත්වයක් හා, කොන්ක්‍රීටය පහසුවෙන් කඩා ඉවත් කළ හැකි බව නිරීක්ෂණය විය.

(iv) මෙම බෝක්කුව සඳහා 2017 නොවැම්බර් 09 දින කොන්ක්‍රීට් දමා තිබුණු අතර, 2017 නොවැම්බර් 16 වන දින වන විටත් එහි සැටලිම ගලවා ඉවත් කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ අතර මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 28 ක් සඳහා සලසා දී තිබුණු රු.822,400 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 34 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 4 සිට සියයට 94 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 17 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර සියයට 3 සිට සියයට 99 අතර පරාසයක විචලනයන් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-------------------------

අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව වර්ෂය පුරා විවිධ ක්ෂේත්‍රවලට අදාළව අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කළ යුතු වුවද, ලැබීම් හා ගෙවීම් සම්බන්ධයෙන් පමණක් අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර තිබුණි.

5. පද්ධති හා පාලනය
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ඇතැම් ස්ථාවර වත්කම් නිෂ්කාර්යව පැවතුණි. |
| | | (ii) | වත්කම් සමීක්ෂණය කර නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | ණයගැති ණයහිමි ශේෂ අඩුවෙන් දැක්වීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| | | (ii) | ඇතැම් වාහන ඌන උපයෝජිතව පැවතීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අය කර නොගැනීම. |
| (ඉ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | ණයගැති ශේෂ අයකර නොගැනීම. |
| | | (ii) | ණයහිමි ශේෂ පියවීමට කටයුතු නොකිරීම. |
| (ඊ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීම. |
| | | (ii) | ව්‍යාපෘති තෝරා ගැනීමේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම. |
| | | (iii) | ඉදිකිරීම්වල නිමාව දුර්වල මට්ටමක පැවතීම. |